(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 87.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 මැයි මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0040/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා රජයට ණය මුදල් ලබා දී ඇති රටවල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ බැංකු සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට ගෙවීමට ඉතිරිව තිබෙන ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1999 වර්ෂය අවසාන වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී රටවල් හෝ ආයතන විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(v) ණය පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාල පරිච්ඡේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ලබාගෙන ඇති ණය මුදල්ද සමග වර්ෂ 2000 සිට 2015 දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සම්පූර්ණ ණය ක්‍රමක්ෂය (මුල් ණය මුදල සහ පොලී ගෙවීම්) කොපමණද;

(ii) ඉහත දක්වා ඇති දත්ත ඇමරිකානු ඩොලර්වලින් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0217/'10

2\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ඇසීමට,— (2)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0508/'10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කර්මාන්ත දියුණු කිරීම උදෙසා රජය අනුගමනය කරන ක්‍රියා මාර්ග කවරේද;

(ii) ඒ සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ග්‍රාමීය කර්මාන්ත පද්ධතිය ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0805/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0869/'10

5.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන්,

(i) ජාතික වශයෙන් සමත්වීමේ ප්‍රතිශතය කොපමණද;

(ii) එක් එක් පළාතේ සමත්වීමේ ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩිම සමත් ප්‍රතිශතය හිමි කර ගත් අධ්‍යාපන කලාප 3 හා එම එක් එක් අධ්‍යාපන කලාපයේ සමත් ප්‍රතිශතය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වීමේ ප්‍රතිශතය වර්ධනය කිරීම සඳහා එතුමා අවශ්‍ය පියවර ගන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1008/'10

6.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් හා වෙනත් ආගමික ආයතන මගින් පවත්වාගෙන යනු ලබන දහම් පාසල්, ඉරිදා පාසල් හෝ එම ගණයේ වෙනත් පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටින ගුරුවරුන් සහ සිසුන් සංඛ්‍යාව;

(iii) එම ආයතන පවත්වාගෙන යෑම සඳහා රජයෙන් දරන වියදම;

එක් එක් ආගම අනුව, වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1057/'10

7.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, සංගුපිටිය මාර්ගයේ සිට පුනරින් නෙට්පුලවු ගම්මානයට පිවිසෙන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) එබැවින් කුඹුරු හා පොල් වගාවන් සහිත එම සුන්දර ගම්මානයේ ජනතාවට දෛනිකව මහත් දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම අබලන් මාර්ගය කඩිනමින් පිළිසකර කිරීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1061/'11

8.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආරම්භ කර ඇති ජාතික පිළිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මාතලේ මහ නගර සභාවත් මධ්‍යම පරිසර අධිකාරියත් අතර 2009 වර්ෂයේ ගිවිසුමක් අත්සන් කර ඇති බවත්;

(ii) එම ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය සඳහා රුපියල් 2,750,000/- ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාතලේ මහ නගර සභාවට ලබා දී ඇති බවත්;

(iii) ගිවිසුමට අනුව 2010 මාර්තු වන විට එම ව්‍යාපෘතිය නිම කළ යුතු වුවද, මාතලේ මහ නගර සභාව මෙතෙක් එය ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත කාලය අවසන් වීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරියට ඒ සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත ගිවිසුම කඩකර තිබියදී මාතලේ මහ නගර සභාවට නැවත එවැනි ගිවිසුමක් අත්සන් කළ හැකිද;

(iii) එසේ නම්, එය පදනම් විය යුතු කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1097/'11

9.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා දකුණු පළාත් සභාව විසින් වර්ෂ 2007 දී පවත්වන ලද තරඟ විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ප්‍රදානය කර තිබේද;

(ii) එසේ නම්, එම පත්වීම් ප්‍රදානය කළ දිනය කවරේද;

(iii) එම විභාගයේදී ප්‍රතිඵල අනුව එක් එක් උපාධිධාරියා විසින් ලබා ගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ලැබූවන්ගේ නම් සහ ඔවුන් ලබාගෙන තිබූ ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත විභාගයේ ප්‍රතිඵල අනුව ගුරු සේවයට බඳවා ගැනීම සඳහා යෝජිතව තිබූ කොන්දේසි කවරේද;

(ii) පත්වීම් ප්‍රදානයේදී පෙර යෝජිතව තිබූ කොන්දේසිවල වෙනසක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම වෙනස් කිරීම් හේතුවෙන් ඉහත විභාගයේ ඉහළම ප්‍රතිඵල ලබා ගත් උපාධිධාරීන්ට සිදු වන අසාධාරණය වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0041/’10

10.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/’10

11.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0751/’10

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීන් පෙර පැවති රජයන් යටතේ ගරු මාරු මණ්ඩලයක් මගින් ක්‍රියාත්මකවූ ගුරු මාරු ප්‍රතිපත්තියක් පැවති බවත්;

(ii) එම ගුරු මාරු මණ්ඩලය අධ්‍යාපන සංවර්ධන අතිරේක ලේකම් යටතේ පත් කරන ලද අධ්‍යක්‍ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වූ බවත්;

(iii) දැනට ගුරු මාරු අංශය ගුරු ආයතන අංශයේ අතිරේක ලේකම් යටතේ ක්‍රියාත්මක වන බවත්;

(iv) මෙතෙක් ඊට අදාළව අධ්‍යක්ෂවරයෙකු පත්කර නොමැති බවත්;

(v) රේඛීය අමාත්‍යාංශයේ ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිලධාරී සංයුතිය සකස්වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගුරු මාරු මණ්ඩලයේ නිලධාරි සංයුතිය සකසා එය ක්‍රියාත්මක කර ගුරු ස්ථාන මාරුවීම් සිදුකිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0808/’10

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස නොමැති පාසල් සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0872/’10

14.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයෙන් පසු අප රට තුළ ජාතික විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය විදුලිය ජනනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති, ජල විදුලි බලාගාර, තාප විදුලි බලාගාර හා වෙනත් බලාගාර වශයෙන් වෙන් වෙන්ව කවරේද;

(iii) එම ව්‍යාපෘති මගින් ජාතික විදුලිබල පද්ධතියට මේ වන විට දායක කර ගත් මෙගා වොට් ප්‍රමාණය සහ ඉදිරියේදී එක් කිරීමට ඉලක්ක කර ඇති මෙගා වොට් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිවලට අමතරව තවත් විශේෂ ව්‍යාපෘති ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සැකෙවින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1058/'10

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනරින් ප්‍රදේශයේ කුඹුරුවල පැතිරී යන රෝගයක් හේතුවෙන් වී වගාවට විශාල වශයෙන් හානි සිදුව ඇති බවත්;

(ii) විශේෂයෙන්ම සෙල්ලයාතිවු, සෙට්ටිය කුරිච්චි, ඥනිමඩල්, කරුක්කායිතිවු, සිත්තක්කුරිච්චි, වාඩියඩි, අත්තායි, තම්පිරායි, සෙල්විපුරම්, ආලංකේණි, නල්ලූර්, කායිල්පුරම්, තියාභම්, නිච්ල්, කරියාලෛ, නාභපඩුවාන්, කුමුලමුනෛ, කිරාන්ජි, වේරවිල් සහ පොන්නාවෙලි යන ප්‍රදේශයන්හි වී වගාවට මෙම රෝගයෙන් දැඩි බලපෑම් ඇතිවී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නැවත පදිංචි වූ එම ප්‍රදේශයේ දුප්පත් ජනතාවට ඉහත සඳහන් රෝගී තත්ත්වය මර්ධනය කිරීම සඳහා කෘමිනාශක භාවිතා කිරීමට අධික මුදලක් වැය කළ නොහැකි බැවින් ඔවුන්ගේ වී වගාව රෝගවලින් ආරක්ෂා කරදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මාර්තු 09 දිනැති අංක 1696/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 උ වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.27 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

4.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

5.

පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

6.

සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

7.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

8.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

10.

ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

11.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

12.

අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව)(සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*17.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*22.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*24.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0668/'10

1\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආනයනය කළ සහල්, පිටි, සීනි, පළතුරු, කුළු බඩු ඇතුළු සියලු ආහාර ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන්;

(ii) එම ද්‍රව්‍ය ආනයනය කළ රටවල්;

(iii) මෙරටට ගෙන්වන ලද ආයතන හා පුද්ගලයින්;

(iv) රටට ගොඩබාන විට එක් එක් ආහාර වර්ගයේ වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

0882/'10

2\.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 ජුලි 29 වැනි දින 'ඩේලි මිරර්' පත්‍රයේ පලවූ ලිපියක, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ නීති සංශෝධනය වෙනුවෙන් අරගල කරන සමහර රාජ්‍ය නොවන සංවිධාන අධික ලෙස මත්ද්‍රව්‍ය භාවිතය වැනි නීති විරෝධී කටයුතු වල යෙදෙන බව සඳහන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නීති විරෝධී කටයුතු පිළිබඳ තොරතුරු ඇති හා ඒවා විශේෂ අවධානයට ලක් කරනු ලබන පුවත්පත්වලින් එවන් ක්‍රියාකාරකම් පිළිබඳව ඔවුන් සතුව ඇති සාක්ෂි පිළිබඳව ප්‍රශ්න කිරීමට; හා

(ii) නීතිය ආරක්ෂා කළ යුතු බවට එවන් පුවත්පත් වලට දැනුම්දීමටත්, නීතියේ වෙනස්කම් තිබීම පිළිගතහැකි පිළිවෙතක් බවත්, අසංවර වචන භාවිතා කොට ඒවාට පහර නොදිය යුතු බවත් දැනුම්දීමට අවශ්‍ය පියවර එතුමා ගන්නෙහිද?

(ඇ) (i) ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීති කොමිසමේ අදහස් උක්ත ලිපියේ ඇතුළත්ද;

(ii) නිර්දේශ කොට ඇති නීති සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය කෙතරම් කාලයක් ගැනීමට බලාපොරොත්තු වන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0903/'10

3\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අළුත්ගම, දර්ගා නගරය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ අනුයුක්ත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන එම්. ආර්. එම්. සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා 2000/11/05 දින සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්;

(ii) සුදුසුකම් සියල්ල සපුරා තිබුනත් කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කර නොතිබීම සහ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඒ මහතාට අපේක්ෂිත උසස්වීම නොලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අංක 82/2000 සහ 2000/08/24 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව අනුව උසස් වීම් ලැබීම සඳහා උපාධිලත් අනුයුක්ත කථිකාචාර්යවරයෙකු 2000/08/24 දිනට වසර 5ක සේවා කාලය සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාව, ශාස්ත්‍රපති උපාධිධාරියෙකු (M.A) වූ සිල්මි මහතා 2000/07/11 දිනය වන විටත් සම්පූර්ණ කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, සිල්මි මහතාට එකී උසස්වීම ලබා දීම තවදුරටත් ප්‍රමාද කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2000/12/08 දින සිට ක්‍රියාත්මකවන පරිදි සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට, එම තනතුරට අදාළ වැටුප් තලය අනුව සියලු හිඟ වැටුප් සහ දීමනා නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0908/'10

4\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සුනාමි නිවාස වැඩ සටහන යටතේ, එක්සත් අරාබි එමීර් රජයේ අනුග්‍රහයෙන්, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගොඩ, ප්‍රදේශයේ "කලීෆාපුර" නම් ගම්මානයේ පදිංචිකරුවන්ට නිවාස ඉදිකිරීමට පියවර ගනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන්කර දෙන ලද මුළු මුදල කොපමණද;

(ii) එහි ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ නිවාස හිමිවූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් නිවාස හිමියා සඳහා ලබා දුන් නිවාස මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කලීෆාපුර නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආයතනය හෝ රාජ්‍ය නොවන සංවිධානය කවරේද;

(ii) එහි අධීක්ෂණ කාර්යයන් සිදුකළ ආයතනය හෝ පුද්ගලයින් කවරේද;

(iii) එම ආයතනයේ හෝ පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0974/'10

5\.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාව තුළ විදේශ රටවල සේවයේ නියුක්ත වී ඇති ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව එක් එක් රට හා රැකියා ක්ෂේත්‍රය අනුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 - 2010 දක්වා කාලසීමාවේදී විදේශ සේවා නියුක්තිය මගින් ශ්‍රී ලංකාව උපයන ලද ආදායම කොපමණද;

(ii) එම ආදායම, සමස්ත රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0975/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කළ යුතු රාජ්‍ය ආයතනය කුමක්ද;

(ii) එසේ ලියාපදිංචිවීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

(iii) මේ වන විට ලියාපදිංචි වී ඇති විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන හඳුනාගෙන තිබේ නම්, එම ආයතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එවැනි නියෝජිතායතන සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී ලියාපදිංචි වී ඇතත් පසු කාලයේදී මූලික කොන්දේසි කඩකිරීම නිසා ලියාපදිංචිය අවලංගු කර හෝ නීතිමය පියවර ගන්නා ලද විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙරට ක්‍රියාත්මක වන විදේශ රැකියා උප නියෝජිතායතන තිබේද;

(ii) එවැනි ආයතන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හෝ රජයේ වෙනත් ආයතනයක ලියාපදිංචි කළ යුතුද;

(iii) එසේ නම්, ඊට අදාළ කොන්දේසි කවරේද;

(iv) එසේ ලියාපදිංචි කර ඇති උප නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?